# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2357/35 - 2023 නොවැම්බර් මස 07 වැනි අඟහරුවාදා - 2023.11.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2016 අංක 10 දරන හෝමියෝපති පනත**

හෝමියෝපති වෛද්‍ය සභාවට සාමාජිකයින් තෝරාපත් කර ගැනීම සඳහා අයදුම්කරුවන් නම් කිරීම

(01). 2016 අංක 10 දරන හෝමියෝපති පනතෙහි 09 වගන්තියෙහි 4 උපවගන්තිය ප්‍රකාරව, හෝමියෝපති වෛද්‍ය සභාව සඳහා සාමාජිකයින් තෝරාපත් කර ගැනීම සඳහා නාම යෝජනා ඉදිරිපත් කරන ලෙසට සාමාන්‍ය ලියාපදිංචි ලේඛනයෙහි ලියාපදිංචි හෝමියෝපති වෛද්‍යවරුන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

(02). මේ සම්බන්ධව 2016 අංක 10 දරන හෝමියෝපති පනතෙහි 3 වගන්තියෙහි උපවගන්ති (අ),(ආ),(ඇ),(ඈ),(ඉ),(ඊ),(උ) හා (ඌ) හා 50 (2) වගන්තියෙහි උපවගන්තිය 2 (ඈ) වෙතද, 1997 හෝමියෝපති සභාව සඳහා සාමාජිකයින් තෝරා පත් කර ගැනීමේ රෙගුලාසි වෙතද අවධානය යොමු කළ යුතුය.

(03). 2016 අංක 10 දරන හෝමියෝපති පනතෙහි, 2 වගන්තියෙහි 3(ආ) උපවගන්තිය ප්‍රකාරව, හෝමියෝපති වෛද්‍යවරුන් පස් දෙනෙකු (05) තෝරා පත් කර ගනු ලැබේ.

(04). වර්ෂ 2023 දක්වා ලියාපදිංචි වාර්ෂික ගාස්තු ගෙවීමට ඉතිරිව නොමැති හෝමියෝපති වෛද්‍යවරුන්, යෝජක ලෙස හෝ ඡන්ද දායකයෙකු ලෙස සැලකීමට සුදුසුකම් ලබයි.

(05). සාමාන්‍ය ලියාපදිංචි ලේඛනයෙහි, සහතික කළ පිටපතක්, කොළඹ 10, පූජ්‍ය බද්දේගම විමලවංශ මාවත, අංක 385, "සුවසිරිපාය" සෞඛ්‍ය අමාත්‍යාංශයේ, හෝමියෝපති වෛද්‍ය සභාවේ සහ සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ප්‍රදර්ශනයට තබා ඇත. මෙම ලේඛනයේ පිටපතක් සහ ආදර්ශ නාම යෝජනා පත්‍රය සෞඛ්‍ය අමාත්‍යාංශ වෙබ් අඩවියෙන් සහ හෝමියෝපති වෛද්‍ය සභා වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(06). ආදර්ශ නාම යෝජනා පත්‍රයට අනුකූල නාමයෝජනා පත්‍රය සමග හෝමියෝපති අරමුදලට රු. 500.00 මුදලක් ගෙවූ බවට පිළිගත් ලදුපතේ පැහැදිලි පිටපතක්ද අමුණා 2023.12.07 දින හෝ එදිනට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අතිරේක ලේකම් (පාලන),
සෞඛ්‍ය අමාත්‍යාංශය, දේශීය වෛද්‍ය අංශය,
අංක 26, 3 වන මහළ,
ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

1A - G 40697 — 07 (2023/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(07). ඉහත සඳහන් අංක 06 යටතේ සඳහන් හෝමියෝපති වෛද්‍යවරුන් සාමාන්‍ය නාමලේඛනයේ නම් පිළිබඳ විරෝධතා ඇත්නම් 2023.12.07 දිනට හෝ එදිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් අංක 06 යටතේ සඳහන් ලිපිනයට එවිය යුතුය.

(08). 1997 හෝමියෝපති සභාව තෝරා පත්කර ගැනීමේ නියෝගයන්හි 2(2) ආ වගන්තියට අනුව ඡන්ද විමසීමේදී පත්‍රිකා එවීම සඳහා, ඡන්ද පත්‍රිකා යැවිය යුතු ලිපිනය ලියුම් කවරයේ වම් කෙළවර "ලිපිනය සඳහන් කිරීම" ලෙස සටහන් කර ඉහත අංක 06 හි සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(09). සාමාන්‍ය ලියාපදිංචි ලේඛනයේ හා අදාළ විස්තරවල පිටපත් සියලුම ලියාපදිංචි හෝමියෝපති වෛද්‍යවරුන් වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමු කරනු ලැබේ.

(10). ඉහත අංක 6 හා 7 යටතේ සඳහන් කරුණු සම්බන්ධයෙන් 2023.12.07 දිනෙන් පසු ලැබෙන ඉල්ලීම් සම්බන්ධව සලකා බලනු නොලැබේ.

ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2023 නොවැම්බර් 08 වැනි දින,
සුවසිරිපාය, අංක 385,
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

EOG 11 - 0075

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.